ආරම්භය: 1945 -09-30 ලි.ප. අංකය: කො 39/482
ධර්ම දානය පිණිස සෑම පුර පසළොස්වක් පොහෝ දිනයක් පාසා නිකුත් කරන
දෙහිවල බෞද්ධෝදය සංගමයේ මාසික ධර්ම පත්‍රිකාව

# බෞද්ධෝදය



"ධම්මො හවේ රකඛති ධමමචාරි"

70 වර්ෂය - ශ්‍රී බු,ව 2559 2015 දෙසැම්බර් 24 උදුවප් කලාපය

## දෙහිවල ශ්‍රී සුදර්ශන ධර්ම නිකේතනාධිපති කොළඹ නාලන්දා විද්‍යාලයේ ධර්මාචාර්ය ශාස්ත්‍රපති පූජ්‍ය ලේල්වල සමිත ස්වාමීන්ද්‍රයන් වහන්සේ

**නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**

## විජය ශ්‍රී ජය ශ්‍රී මහ බෝධිය

බුදුවරයකු ලොව පහල වීම හා සම්බන්ධව පුරා වෘත්තයන් හි විවිධ වෘක්ෂ මූලයන් ගැන සඳහන් වේ. ඒ අනුව එකී වෘක්ෂයන් එම ඇසුරු කළ වෘක්ෂ බෝධි යනුවෙන් හඳුන්වනු ලැබේ. ගෞතම බෝසතාණන්ට බුදුවීමට උපකාරි වූ වෘක්ෂය ඇසතු රුක නම් වේ. මේ වෘක්ෂය බුද්ධත්වය පිණිසම පහළ වූ වෘක්ෂයක් හෙයින් ද දසබිම්බරක් මරසේනාව පළවා හැර. මනුෂ්‍යයකු වශයෙන්, උපරිම අවබෝධය, ඥාණය ලබා ගත් හෙයින් ද එතැන් සිට ඇසතු වෘක්ෂය විජය ශ්‍රී ජය ශ්‍රී මහ බෝධිය නමින් ප්‍රකට විය.

එතෙක් සක්වල ගලින් එපිට සැඟවී බලා සිටි දිව්‍ය සමූහය පරාජය පාපි මාරයා හටය. ජය සිද්ධාර්ථ තාපසයාණන්ට යයි පවසා නාග, දිව්‍ය, බ්‍රහ්ම යන පිරිස බෝධීන් වහන්සේ වෙත පැමිණ,

**"ජයෝහි බුද්ධස්ස සිරිමතො - අයං මාරස්ස ච පාපිමතො
පරාජයො උග්ඝෙසයුං - බෝධිමණ්ඩේ පමොදිතා
ජයං තදා නාගනා මෙහෙසිනො"**

යනුවෙන් ජයඝෝෂා කළහ. දස දහසක් ලෝක ධාතු අසිරිමත් අලංකාරයෙන් බැබළ විය. දස දහසක් සක්වලෙහි ඵල ගන්නා තුරුලිය ඵලින් වැඩි ගියේය. දස දහසක් ලෝකධාතුහු එක්ව කැටි කොට එක මල් ගුලා එක් මෙන්දව මැනවින් අතුරාලූ මල් ඇතිරියක් සේ පෙනෙන්නට වූහ. හිරු හතක් පායන කල්හි වුවද ආලෝකයක් නොලැබෙන, ලෝකන්තරිය නරකය පවා එදින ආලෝකවත් විය. මුහුදු ජලය මිහිරි විය. ගංගාවෝ නිසල වූහ ජාත්‍යන්ධයෝ ඇස් ලැබූහ. බිහිරෝ කන් ලැබූහ.මෙසේ අශ්චර්ය අත්භූත ධර්මයන් ලොව පහළ වෙද්දි,

බෝසතාණන් වහන්සේ, සර්වඥතා ඥාණය ලබා ගෙන ප්‍රථම බුද්ධ වචනය වදාළහ.

බුද්ධගයාවේ සුපිහිටි ජය ශ්‍රී මහ බෝධියත් සිදුහත් කුමරුත් එකම දිනක පහළ වූ බව සඳහන් වේ. මේ නිසා ශ්‍රී මහා බෝධිය සජිවී වස්තුවක් ලෙස ජීවමාන බුදු කෙනෙකුන් ලෙස සලකා වැඳුම් පිදුම් කරනු ලබයි.

බෝධි යනු අවබෝධය යන අරුත් ගෙන දෙයි. චතුසත්‍යාව බෝධිය හේතුඵල සහිතව අවබෝධ කර ගැන්ම සිදු වූවකි. පටිච්ච සමුප්පාදය හා ත්‍රිලක්ෂණ දේශනය ද අවබෝධය තුළින් සිදුවූවකි. (හෙතු පටිචච සමභූතං හෙතු භඞගා නිරුජ්ඣතී)

සුජාතාවගේ කිරිපිඬු වැළඳූ බෝසතාණෝ නදියෙහි පාත්‍රය උඩුගම් බලා යනු සතුටුව බුද්ධගයාවේ බෝධි මණ්ඩපයට පැමිණ වජ්‍රාසනයෙහි වැඩ හිඳ චතුරංග සමන්නාගත වීර්‍ය්‍යයෙන් කටයුතු කළහ.

බුද්ධත්වය ලබා ගත් උන්වහන්සේ අනෙකජාති සංසාරං සදධා විස්සං අනිම්මිසං.... ආදි වශයෙන් උදන් ඇනුහ.

මේ අවබෝධය බෝධි, සම්බෝධි, සම්මා සම්බෝධි, අභිසම්බෝධි යන වචන වලින් හැඳින්වේ. ඇසතු වෘක්ෂය බෝධීන් වහන්සේ බවට පත්වීමේ ශ්‍රේෂ්ඨ ප්‍රතිඵලය එයයි.

**01. සුජාතා දේවිය ඔබගේ ප්‍රාර්ථනාවන් ඉටුවේවායි ප්‍රකාශ කිරිම.**

**02. කිරිපිඬු වළඳා රන්පාත්‍රය උඩුගම් බලා යාමෙන් ඇතිවූ ප්‍රමෝදය.**

**03. වජ්‍රාසන මස්තකයේ වැඩ සිටිමේදී චතුරංග සමන්නාගත වීර්‍ය්‍යයෙන් ක්‍රියා කිරිමෙන් ඇති වූ ප්‍රමෝදය.**

**04. මාර පරාජය කොට හේතු ඵල ධර්මය අවබෝධ කොට බුද්ධත්වයට පැමිණ උදන් ඇනිම යන මේ කරුණු "බෝධි" වචනය තුළ අන්තර්ගතය.**

බෝධි මූලයෙහි සියල්ල දැනගත් නුවණ පහළ විය. (සර්‍වඥතා ඥාණය සතියක්, බෝධි මූලයෙහි සමාපත්ති සුවයෙන් වැඩ සිටි අතර සතියක් අනිමිස ලෝචන පූජාව,(නේත්‍රා පූජාව) කළ සම්බුදු පියාණන් වහන්සේගෙන් පූජා ලබාගත් එකම වස්තුව ශ්‍රී මහ බෝධියයි.

ශ්‍රී මහා බෝධිය (ඇසතු ගස) හඳුන්වන්නේ ෆිකුස් රිලජියෝසා යන විද්‍යාත්මක නාමයෙනි. ඉන්දියාව-ලංකාව ඇතුළු දකුණු ආසියාතික රටවල බහුලව දක්නට ලැබෙන බව විද්‍යාඥයන්ගේ මතය වේ.

# බෝධි පූජාවේ ආනිශංස

බෝධි පූජාවක් සිදු කිරිමේදී ලැබෙන ආනිශංස බොහෝය. භෞතික දියුණුවට මෙන්ම ආගමික අංශයෙන් සංවර්ධනයක් පතා බෞද්ධ ජනතාව බෝධින් වහන්සේ වෙත පැමිණ පුද පූජා කිරිම, අපේ ඉතිහාසයේ සිට දක්නට ලැබෙන සුලභ සිද්ධියකි.

**''කතඤ්ඤු කතවේදි පුග්ගලෝ දුල්ලභෝ ලෝකස්මිං''**

කලගුණ සැළකීම බෝධි පූජාවේ උත්කෘෂ්ට ආනිශංසය ලෙස හැඳින්විය හැක. බෝධි පූජාවෙන් මෙලොව පරලොව අභිවෘද්ධිය ඇති කරයි. මානසික සැනසීම මානසික දියුණුව මෙන්ම මානසික ප්‍රාර්ථනයන් ඉටුකර ගත හැක.බෝධි පූජාව බුද්ධානුස්සති භාවනාවකි. ඒ තුළින් භාවනාමය පුණ්‍ය කර්මයක් සිදු කරගත හැක.

බෝධි පූජාව සිදු කිරිමට පෙර බෝ මළුව පිරිසිදු කිරිම වතාවත් සිදු කිරිමේදී තම යහපත් සිතුම් පැතුම් සත් පුරුෂ ප්‍රාර්ථනයන් ඉටු කරගත හැක. බෞද්ධයෝ නිතර නිතර ගොස් බෝධි පූජා සිදු කිරිමේ දී බෝධියද අප හඳුනා ගනි. සසර ගමනේදී අපට පිහිට වන පුණ්‍ය ශක්තියක් බෝධි පූජාව තුළින් ලැබෙනු ඇත.

එසේම බෝ මණ්ඩපයෙහි පරිසරය පිරිසිදු වීම. යහපත් වචන කථා කිරිම, පිරිසිදු මල් පහන් පූජා කිරිමට ආදි හේතු නිසා විශේෂ බල මහිමයක ඇති වනු ඇත. තුන්දොර සංවර කර ගෙන බෝධි පූජාවක් සිදු කිරිම, බොදුනුවන්ට ආකල්ප ශක්තිය සෙත් ශාන්තිය ගෙන දේ. බෝධින් වහන්සේට ද්විත්ව බලයක් ඇත. ඒ අනුව බෝධි පූජාව පවත්වන අවස්ථාවේ සන්සුන් සිතින් සිය දුක පැවසිම යහපත උදා කරයි.

දරුවකුගේ උපන්දිනය වෙනුවෙන් දරුවාට ලබාදිය හැකි හොඳම ත්‍යාගය බෝධි පූජාවක් පවත්වා එම දරුවාට ආශිර්වාද ප්‍රාර්ථනා කිරිමයි. සියලු අපල දුරු කර ගන්නට ඇස්වහ කටවහ හෝ වහ ආදී අපල දුරු කර ගත හැක. දෙමාපිය ගුරුවර නෑ හිතමිතුරන්ට දිගාසිරි ප්‍රාර්ථනා කරන්නට හැකියාව ලැබේ.බෝධි පූජාව සිදු කොට මළගිය ඥාතින්ට පිං දෙන්නද පුළුවනි. බෝධි පූජාව ශාන්ති කර්මයකි. බෝධි පූජාව සිද්ධ කරන අවස්ථාවේදී ගුණ ගරුක වීම, සංවර වීම, අර්ථවත් වීම, අත්‍යාවශ්‍යයි. බෝධි පූජාව හිත හදන සාමකාමි පිංකමකි.

ලෞකික ජිවිතයෙහි මුහුණපාන ත්‍රිවිධ භය දුරු කරගෙන මෙලෝ වශයෙන් සෙත් ශාන්තිය උදා කර හැකිය. බෝධිය සංකේතයක් හැටියට සලකා අප වඳින්නේ පුදන්නේ, බුදුරජාණන් වහන්සේගේ ගුණයන්ට බවද මතක තබා ගත යුතුය.

බෝධි වන්දනාව පිළිබඳව ඇතමුන් දුර්මත පළ කරත් දැනට කර ඇති විද්‍යාත්මක පර්යේෂණ වලින් ද බෝධියේ මහිම මොනවට ඔප්පු වී තිබේ.

උදාහරණ වශයෙන් කියතහොත් බෝ කොළයක අග කොටසින් විහිදෙන කිරණ බෝධිය පිදිමට යන බැතිමතුන්ගේ මානසික ශක්තියට බලපෑමක් ඇති කිරිම, ශක්ති හුවමාරුවක් සිදු වීම, ඒ අතර ප්‍රධාන වේ. බෝධියට අඩි විස්සක් පමණ දුර විහිදෙන ශක්තියක් ඇත. විවිධ දුක් කම්කටොලු වලින් පිරි සාමාන්‍ය පුහුදුන් ජනතාව බෝධිය වෙත පැමිණ සැදැහැවත් සිතින් යුතුව විවිධ පුද පූජා කිරිමෙන් අපමණ ශක්තියක් ලබා ගැනිම දක්නට හැකිය. බෝධිය වෙත පැමිණෙන අනවශ්‍ය ලෙස පහන් හඳුන්කුරු දැල්විම නොකල යුතු බව සිහිපත් කරමි. කොඩි එල්ලිමේදි ද සතුන්ගේ රූප යොදා ඇති කොඩි සහ නම් ගැසු කොඩි එල්ලිම සුදුසු නැත. නවගුණ ලියු කොඩි එල්ලන්න පුලුවන. මල්මාලා පැළදීම කල හැක.

බෝධි පූජාවක් පැවැත්විමේදී ඒ පවත්වනු ලබන පුද්ගලයා හෝ පිරිස ඉතා හොඳ පිළිවෙත් අනුගමනය කරන්නේ නම් වඩා ප්‍රතිඵලදායක වේ. විශේෂයෙන් මස් මාංශවලින් වැළකි, ගුණදහම් අනුව පවුලේ අය හා ඇසුරු කරන අය සමග ද හොඳ සම්බන්ධතා පවත්වමින්, ශ්‍රද්ධා වෙන් යුක්තවම බෝධි පූජාවට දායකවීම ගුණදායකය. බුද්ධ, ධම්ම,සංඝ යන ත්‍රිවිධ රත්නය කෙරේ ශ්‍රද්ධා සම්පන්නව ඉටු කළ යුතුය.

බෝධි පූජා කවි, බුදුගුණ, දහම් ගුණ, සඟ ගුණ අන්තර්ගත කොට ලියවි ඇත. මේ තුලින් ලෞකික ලෝකෝත්තර දියුණුව උදා කර ගත හැක.